# බුද්ධිමත් කුරුල්ලෝ



දිහන්සා සෙතුනි ඉලංගරත්න

1 – E

# බුද්ධිමත් කුරුල්ලෝ


කතෘ

දිහන්සා සෙතුනී ඉලංගරත්න


සිතුවම්

දිහන්සා සෙතුනී ඉලංගරත්න


**ISBN No**

**978-624-206-827-5**

දිනය

2023.11.15

**පිදුම**

පුංචි මල් කැකුළු වන්

අපගේ අනාගතය

යහපත් කරන්නට වෙරදරන

මහමායා විදුහල් මෑණියන්ට

මහත් හද බැතියෙන්

මෙම පොත පුද කරමි

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණ අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය,ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.


මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.11.01

ඔන්න එකමත් එක කාලෙක කුරුලු අම්මෙක් හා කුරුලු තාත්තෙක් හිටියා. ඔවුන්ට කුරුලු බිත්තර දෙකක් තිබුණා.

එක දවසක් කුරුලු අම්මයි තාත්තයි බඩගිනි වෙලා කෑම සොයන්න කැලෑවට ගියා.





කුරුලු නිවස ලඟින්ම තුඹසක් තිබුණා. ඒ තුළ නයෙක් හිටියා.

ඒ නයා හිතුවා කුරුලු ගෙදර කවුරුත් නැති අතරේ ගිහින් බලන්න ඕන කියලා. ඊට පස්සෙ නයා හිමින් හිමින් ගස උඩට නැංගා. කූඩුව තුළ විශාල බිත්තර දෙකක් තියෙනවා නයා දැක්කා.

නයා හිතුවා දැන් මට බඩපිරෙන්න බිත්තර කන්න පුළුවන් කියලා.



නයා බිත්තර දැක ඒවා කෑමට ආශාවෙන් එක් බිත්තරයක් කටට දාගත්තා. අනේ ඒත් ඒ බිත්තරය නයාගේ උගුරේ හිරවුණා.

අමාරුවෙන් ගාට ගාට ගසෙන් බිමට බැස්ස නයි හාමි තුඹස අසල වැතිරුණා.



කුරුලු අම්මයි කුරුලු තාත්තයි කෑම සොයාගෙන එන විට ඉබි රාල ඔවුන්ට අත වැනුවා.

ඉබි රාල කතා කරන්නෙ කුමකටදැයි බැලීමට කුතුහලයෙන් කුරුලු අම්මයි කුරුලු තාත්තයි ඉබි රාල ළඟට පාත් උනා.

ඔබේ නිවසෙ පැත්තට නයි හාමි ගියා. කුමක් හෝ කරදරයක්ද දන්නෙ නෑ යැයි ඉබිරාල කීවා.



කුරුලු අම්මයි, තාත්තයි කලබලයෙන් නිවස දෙසට පියෑඹුවා.

අනේ එක් බිත්තරයක් අඩු බව කුරුලු අම්මා දුටුවා. වේගයෙන් නයි හාමිගේ තුඹස ළඟට ගියා. නයි හාමි බිත්තරය ගිලලා. ඒත් ඒක උගුරේ හිරවෙලා. කුරුලු තාත්තා නයි හාමිගේ බෙල්ල පිරිමැද්දා.

උගුරෙ හිරවී තිබූ බිත්තරය එලියට ආවා.

නයි හාමිට තිබුණ අමාරුව නැති වුණා.



නයි හාමි කුරුළු අම්මටයි තාත්තටයි මෙහෙම කීවා. "අනේ... මම ඔබලාගෙ බිත්තරය ගිල්ලාට සමාවෙන්න. මම හිටියේ ගොඩාක් අමාරුවෙන්ග මගේ ජීවිතය බේරුවාට බොහොම ස්තූතියි. මම ආපහු කවදාවත් නරක වැඩ කරන්නේ නෑ".

කුරුළු අම්මා හා තාත්තා බිත්තරය රැගෙන නිවසට ගියා.

"අපි වෙනත් ප්‍රදේශයක නැවත කූඩුවක් හදමුයි" යැයි කුරුළු අම්මා යෝජනා කලා.

එයට කැමති වූ කුරුළු තාත්තාද පැවසුවේ "අප සිටින්නේ අනාරක්ෂිත තැනක. නිවස හදන්න කලින් අපට කල්පනා කරන්න තිබුණා. කමක් නෑ. දැන් අපි වෙන ප්‍රදේශයකට යමු".



නොගැලපෙන ප්‍රදේශයක සිටීමෙන් කරදරයට පත්වීමට සිදුවන බව කුරුළු අම්මා හා තාත්තා තේරුම් ගත්තා.

ටික දිනකින් කුරුළු බිත්තර පුපුරා ලස්සන කුරුළු පැටව් දෙන්නෙක් මෙලොව එළිය දුටුවා.

ඒ පැටව් හා අම්මයි තාත්තයි සතුටින් කාලය ගත කලා.



## ස්තූතිය

කතන්දර පොතක් ලියන්න කියා මාව දිරිමත් කළ මාගේ ආදරණීය ගුරු මෑණියන්ටත්,

මම කතන්දරය කියන විට එය ලියූ මාගේ ආදරණීය අම්මාටත්,

කතන්දරය අසා සතුටු වුණ මාගේ ආදරණීය අප්පච්චීටත්, අයියා සහ නංගීටත්,

දහසකුත් වැඩ මැද මාගේ මෙම කතන්දරය ටයිප් කර සකසා දුන් මාගෙ නැන්දට සහ මාමාටත්

මාගෙ හද පිරි ප්‍රණාමය පුද කර සිටිමි.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුල ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කරු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.11.01